ශ්‍රේණිය :7


වාරය: III

නිපුණතා මට්ටම (1.2.5) : මෝස්තර සැරසිලි කරමු.


ක්‍රියාකාරකම: වාටි සැරසිල්ලක් අඳිමු.

අවශ්‍ය ද්‍රව්‍ය: ඔබ කැමති වර්ණ මාධ්‍යක් ( පැස්ටල්, දිය සායම්) , A4 කඩදසියක්, පැන්සලක්

පියවර 1 : A4 කඩදාසිය තිරස් අතට දෙකට නවන්න.




පියවර 2: නමන ලද කඩදාසිය දෙකට නවා නැවත එය දෙකට නවාගන්න. කඩදාසිය දිග හැර බැලූ විට පහත රූපයේ ආකාරයට දිස් වේ.



පියවර 3: දිග් අතට එක් තීරයක එක කොටුවකට වාටියකට සුදුසු ඔබ කැමති දෙයක් ඇඳ ගන්න. ( මාළුවෙක්, මලක්)

පියවර 4: ඇඳගත් පින්තූරය උඩට එන ලෙස කඩදාසිය නැමුම් දාර දිගේ නවාගන්න.

පියවර 5: ඇඳගත් පින්තූරය අනිත් කොටුවලට පිටපත් වන සේ අතින් තද ඇඳ කඩදාසිය දිග හැර පිටපත් වී ඇති හැඩය පැන්සලෙන් නැවත ඇඳ ගන්න. දිග හැර බැලූ විට පහත



ආකාරයට දිස් වේ.

කඩදාසියේ ඉහළ කොටස හිස්ව තබන්න. ඇඳගත් මෝස්තරය ද්වීතියික වර්ණ යොදා වර්ණ ගන්වන්න.

ඩී.කේ. දිලානි අලුත්ගෙදර- ර/ හෝප්වෙල් විද්‍යාලය